# ශ්‍රීලංකන් ගුවන් සමාගම - PB 67

## මාර්ගගත තාක්ෂණය ඔස්සේ පැවත්වෙන අතිවිශේෂ මහා සභා රැස්වීම පිළිබඳ මාර්ගෝපදේශන සහ ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය

| |
|---|
| මාර්ගගත තාක්ෂණය ඔස්සේ පැවත්වීමට නියමිත ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අතිවිශේෂ මහා සභා රැස්වීමට සහභාගී වීමට අපේක්ෂා කරන කොටස් හිමියන්ට/ පෙරකලාසිකරුවන්ට ස්මාර්ට් ජංගම දුරකථනයක් හෝ පරිඝනකයක් භාවිත කරමින් ඊට සහභාගී විය හැක.<br>කොටස් හිමියෙකු හෝ පෙරකලාසිකරුවෙකු ස්මාර්ට් ජංගම දුරකථනයක් හරහා මෙම අති විශේෂ මහා සභා රැස්වීමට සහභාගී වන්නේ නම්, ඔහුගේ/ ඇයගේ ස්මාර්ට් ජංගම දුරකථනයට “Zoom Mobile App” එක බාගත යුතුය.<br>එමෙන්ම කොටස් හිමියෙකු හෝ පෙරකලාසිකරුවෙකු පරිගනකයක් හරහා මෙම අති විශේෂ මහා සභා රැස්වීමට සහභාගී වන්නේ නම්, ඔහුගේ/ ඇයගේ පරිගනකයට “Zoom Desktop App” එක ඇතුළත් කරගත යුතු ය. (මේ සඳහා Google Chrome සෙවුම් යන්ත්‍රය භාවිත කළ හැක). |

1. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අතිවිශේෂ මහා සභා රැස්වීමට සහභාගී වීමට අපේක්ෂා කරන කොටස් හිමියන් ඔවුන් විසින්ම හෝ පෙරකලාසිකරුවන් හරහා තම තොරතුරු (අමුණා ඇති ලියාපදිංචි පෝරමය පරිදි), ශ්‍රීලංකන්හි සමාගම් ලේකම් වෙත යොමු කළ යුතුය.

2. නිවැරදිව සම්පූර්ණ කරන ලද ලියාපදිංචි වීමේ පෝරමය, සමාගම් ලේකම්, ගුවන්සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කටුනායක යන සාමානය තැපැල් ලිපිනය හෝ comsec@srilankan.com යන ඊමේල් ලිපිනය හරහා හෝ +94197335112 යන ෆැක්ස් අංකය හරහා 2024 ජුනි 23 වැනිදා ප.ව. 3ට පෙර, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ, සමාගම් ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. පෙරකලාසිකරුවකු මාර්ගයෙන් රැස්වීමට සහභාගී වීමේදී, අතිවිශේෂ මහා සභා රැස්වීම ආරම්භ වීමට පැය 48කට පෙර, එනම් 2024 ජුනි 23 වැනිදා ප.ව. 3ට පෙර, සම්පූර්ණ කරන ලද පෙරලාසිපත්‍රය **‘ශ්‍රීලංකන් ගුවන් සමාගම, ගුවන්සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කටුනායක’** යන ලිපිනයෙහි පිහිටි සමාගමේ ලියාපදිංචි කායීාලයට ලැබීමට සැලස්වීම අනිවායීවේ.

   <u>සටහන</u>:
   පෙරකලාසිකරුවකු පත්කරන ලද අවස්ථාවකදී, කොටස් හිමියා විසින් ඉදිරිපත් කරනු ලබන ලියාපදිංචි පෝරමයේ දැක්වෙන පෙරකලාසිකරුගේ තොරතුරු සහ පෙරකලාසි පත්‍රයේ සඳහන් තොරතුරු එකිනෙක ගැලපිය යුතු ය.

4. ඉහත සඳහන් කළ ආකාරයට ලැබුණු සියලු ලියාපදිංචි වීම් අයදුම්පත් සහ හඳුනාගැනීමේ තොරතුරු, සමාගම සතු කොටස් හිමි ගොනුව හා සසඳමින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුව, අතිවිශේෂ මහා සභා රැස්වීමට අදාළව කොටස්හිමියන් විසින් සපයා ඇති අයදුම්පත් සහ තොරතුරු පිළිබඳ සෑහීමකට පත් විය හැකි නම් සමාගම විසින් අනුමැතිය ලබා දෙනු ඇත.

   අතිවිශේෂ මහා සභා රැස්වීමට සහභාගි වීම සඳහා පිළිගනු ලැබූ කොටස්හිමියන්ට ඒ පිළිබඳව ඊමේල් පණිවුඩයක් හරහා දැනුම් දෙනු ලැබේ.

5. ලියාපදිංචි කිරීම තහවුරු කරන ලද කොටස් හිමියන්ට අතිවිශේෂ මහා සභා රැස්වීම ආරම්භ වීමට පැය 24කට පෙර තවත් ඊමේල් පණිවුඩයක් ලැබෙනු ඇත. එහි " Virtual EGM Registration" යනුවෙන් රැස්වීමට සහභාගි වීමට භාවිතා කළ යුතු වෙබ් සබැඳිය (web link) ඇතුළත් වේ. කොටස්හිමියා විසින් පෙරකලාසිකරුවෙකු පත් කර ඇති අවස්ථාවක මෙම වෙබ් සබැඳිය සහිත ඊමේල් පණිවුඩය පෙරකලාසිකරු වෙතද යවනු ලැබේ.

6. (i) කොටස්හිමියන් සහ පෙරකලාසිකරුවන්, ඉහත අංක 5හි සඳහන් ආකාරයට සමාගම විසින් ලබා දුන් වෙබ් සබැඳිය භාවිතා කරමින් අතිවිශේෂ මහා සභා රැස්වීමට මාර්ගගත ක්‍රමවේදයට ලියාපදිංචි වීම සඳහා " Virtual EGM Registration" යන තීරය ක්ලික් කළ යුතුය.

(ii) "Virtual EGM Registration" යන සබැඳිය ක්ලික් කිරීමෙන් අනතුරුව පැමිණෙන නව තීරය තුළ කොටස්හිමියන් සහ පෙරකලාසිකරුවන් තම මුල් නම, පෙළපත් නාමය, ඊමේල් ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා කාර්ය මණ්ඩල අංකය යනාදිය ඇතුළත් කළ යුතුය. (මෙහිදී තොරතුරු ඇතුළත් කිරීමේදී ඉහත අංක 2හි සඳහන් ආකාරයට නිවැරදිව තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු අතර, යම් හෙයකින් ලියාපදිංචි පෝරමයේ ඇති තොරතුරු සහ මෙහිදී ඇතුළත් කරන තොරතුරු අතර නොගැළපීමක් පැවතුණහොත් අතිවිශේෂ මහා සභා රැස්වීමට සහභාගි වීමේ අවස්ථාව ගිලිහී යනු ඇත. )

(iii) ඉහත 6 (ii) කොටසෙහි දක්වා ඇති ආකාරයට නිසි ලෙස තොරතුරු ඇතුළත් කිරීමෙන් අනතුරුව, රැස්වීමට සහභාගී වන්නන්, **"REGISTER"** බොත්තම එබිය යුතුය. එවිට ඔවුන්ට අතිවිශේෂ මහා සභා රැස්වීමට අදාළ සබැඳිය (Link) ලැබෙනු ඇත.

7. ඉහත අංක 6හි දක්වා ඇති ආකාරයට සාර්ථකව මාර්ගගත ලියාපදිංචිය සම්පූර්ණ කළ කොටස්හිමියන්ට "**Join the Virtual EGM of SRILANKAN AIRLINES LIMITED**" යනුවෙන් රැස්වීමට අදාළ වෙබ් සබැඳිය හා සත්‍යාපනය කිරීමට ගැනෙන අතිරේක තොරතුරු (credentials) හිමි වේ.

8. අතිවිශේෂ මහා සභා රැස්වීමට සහභාගි වීම සඳහා "**Join the Virtual EGM of SRILANKAN AIRLINES LIMITED**" මත ක්ලික් කළ යුතු ය. ඇතැම් විට රැස්වීමට සම්බන්ධ වීමට අතිරේක තොරතුරු ද පද්ධතිය මඟින් ඉල්ලා සිටින විටෙක, සත්‍යාපනය කිරීමට අදාළ අතිරේක තොරතුරු නිවැරදිව ඇතුළත් කර රැස්වීමට පිවිසිය හැක.

9. මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කළ පසු ඔබට මාර්ගගත ක්‍රමවේදයට පැවැත්වෙන අතිවිශේෂ මහා සභා රැස්වීමට සම්බන්ධ විය හැක.

| |
|---|
| ඉහත සඳහන් පියවර අංක 6, 7, 8, සහ 9 සම්පූර්ණ කර අතිවිශේෂ මහා සභා රැස්වීම ආරම්භ වීමට අවමයෙන් මිනිත්තු 10 කට පෙර ඊට සම්බන්ධ වන ලෙස කොටස්හිමියන්ට සහ පෙරකලාසිකරුවන්ට උපදෙස් දෙනු ලැබේ. රැස්වීම ආරම්භ වීමට නියමිත වෙලාවට මිනිත්තු 30ක පෙර පටන් රැස්වීම වෙත සම්බන්ධ වීමේ හැකියාව පවතී. |

10. කොටස්හිමියන් සහ පෙරකලාසිකරුවන්, තිරය මත දිස්වන Q & A බොත්තම හෝ Hand Raise (✋) බොත්තම භාවිතා කර තමන්ට ඇති ගැටලු සහ ප්‍රශ්න වාචිකව හෝ ලිඛිතව ඉදිරිපත් කළ හැක. තව ද මයික්‍රෆෝන් හා වීඩියෝ දර්ශන ක්‍රියාත්මක කිරීමට පද්ධතිය හරහාම පණිවුඩයක් (pop up message) මතු වනු ඇත. කෙසේ නමුත් අතිවිශේෂ මහා සභා රැස්වීම තුළ අවධානයට ලක්වන සාමාන්‍ය යෝජනාව පිළිබඳ කොටස්හිමියන්ට ගැටලු ඇත්නම්, ඒවා කල්තබා තැපැල් මඟින් හෝ ඊමේල් මඟින් දැනුම් දිය යුතුය.

11. සියලුම සුදුසුකම් ලත් කොටස් හිමියන් සහ ප්‍රොක්සි දරන්නන් සම්බන්ධයෙන් ඉහත 8 හි දක්වා ඇති ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසුව, විශාලන අතුරුමුහුණත මත දිස්වන ඡන්ද විමසීමේ විශේෂාංගය හරහා සාකච්ඡාවට භාජනය වන යෝජනා සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම. පොළඹවන විට, අතථ්‍ය සහභාගිවන්නන්ට 2024 මැයි 17 දිනැති අතිවිශේෂ මහා සභා රැස්වීමේ දැන්වීමේ ඇතුළත් සියලුම යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා විශාලන යෙදුම හරහා ඔවුන්ගේ අභිමතය පරිදි ඍජුවම ඡන්දය ප්‍රකාශ කළ හැකිය.


12. මාර්ගගත ක්‍රමයට අතිවිශේෂ මහා සභා රැස්වීමට සම්බන්ධ වී සිටින සියලුම කොටස් හිමියන්ට සහ පෙරකලාසිකරුවන්ට යෝජනා සම්බන්ධයෙන් ඡන්දය භාවිතා කිරීමට ඔවුන්ගේ Zoom තිරය මත නව තිරයක් මතුවනු ඇති අතර, ඡන්දය ප්‍රකාශ කිරීමට සපයා ඇති අවකාශය තුළ සිය අභිමතය පරිදි ඡන්දය ප්‍රකාශ කර SUBMIT බොත්තම එබීමෙන් පසු සමාගම වෙත අදාල ඡන්දය ලබාගත හැක.

13. අදාල යෝජනාව සම්බන්ධ ඡන්ද ප්‍රකාශයට පත් කිරීමේදී අතිවිශේෂ මහා සභා රැස්වීමට මාර්ගගත තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වී සිටින කොටස් හිමියන්ගේ/පෙරකලාසිකරුවන්ගේ ඡන්ද ද සභාපතිවරයා විසින් සැලකිල්ලට ගනු ලැබේ. අනතුරුව එම ඡන්ද මාර්ගගත ක්‍රමයට සම්බන්ධ වී සිටින කොටස් හිමියන්ගේ/පෙරකලාසිකරුවන්ගේ ඡන්ද සමග එකතු කරනු ලැබේ.

14. එක් යෝජනාවකට අදාල ඡන්දය ප්‍රකාශ කිරීමට කොටස් හිමියන්ට/පෙර කලාසිකරුවන්ට තත්පර 60 ක කාලයක් හිමිවේ. ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වෙන්කර ඇති කාල සීමාව අවසන් වී තත්පර 15 ක් ඇතුළත සභාපතිතුමා ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කරයි.

15. නැවත ඡන්ද විමසීමක් ඉල්ලා සිටින සහ කොටස් හිමියන් යළි ඡන්දය භාවිතා කළ යුතු අවස්ථාවකදී ඉහත පියවර ක්‍රියාවලියම අනුගමනය කළ හැක. එයද සභාපතිතුමා විසින්ම මෙහෙයවනු ලැබේ.

| |
|---|
| අතිවිශේෂ මහ සභා රැස්වීම ආරම්භ වීමට අවම පැය 3කට පෙර මාර්ගගත ප්‍රවේශය මෙන්ම, රැස්වීමට සම්බන්ධ වීමට ඔබ යොදා ගන්නා උපාංගයේ ශබ්ද ක්‍රියාකාරිත්වය නිසි පරිදි සිදුවේද යන්න පරීක්ෂා කර බැලීමටත් උපදෙස් දෙනු ලැබේ. එවිට ඔබට වැඩි පහසුවකින් යුතුව අතිවිශේෂ මහ සභා රැස්වීමට සහභාගිවීමේ අවස්ථාව උදාවනු ඇත. |


Steps 1-3
නිසි පරිදි සම්පූර්ණ කර අත්සන් කරන ලද REGISTRATION FORM ස්කෑන් කර හෝ එහි පින්තූරයක් විද්‍යුත් තැපෑලෙන් comsec@srilankan.com වෙත ලැබෙන්නට සැලස්විය යුතුය.
Step 4
සමාගම් ලේකම් කාර්යාලය මගින් විස්තර තහවුරු කිරීම
Approved
Step 5
කොටස් හිමියාට/පෙරකලාසිකරුට විද්‍යුත් තැපෑලක් ලැබේ (අථන්‍ය අතිවිශේෂ මහා සභා රැස්වීම ආරම්භ වීමට පැය 24කට පෙර)
Step 6 (i)
“Virtual EGM Registration” ක්ලික් කරන්න
Not Approved
Access to the VEGM Rejected
Step 6 (ii)
විස්තර ඇතුලත් කරන්න (මුල් නම, පෙළපත් නාමය, ඊමේල් ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය සහ කාර්ය මණ්ඩල අංකය)
Step 6 (iii)
“Register” ක්ලික් කරන්න
සමාගම් ලේකම් කාර්යාලය මගින් විස්තර තහවුරු කිරීම
Approved
Step 7
කොටස් හිමියාට/පෙරකලාසිකරුට රැස්වීම් සබැඳිය ලැබෙනු ඇත
Step 8
“Click here to Join the Virtual Meeting” ක්ලික් කරන්න (සත්‍යාපනය කිරීමට අවශ්‍යය නම් අතිරේක තොරතුරු ඇතුලත් කරන්න)
Step 9
කොටස් හිමියා/පෙරකලාසිකරු අතථ්‍ය අතිවිශේෂ මහා සභා රැස්වීමෙහි සූම් තාක්ෂණය වෙත යොමුවෙනු ඇත
Step 10
කොටස් හිමියෙකුට හෝ පෙරකලාසිකරුවෙකුට ප්‍රශ්නයක් හෝ ගැටලුවක් ඇත්නම්
“Q & A” tab හෝ අත් එසවීමේ අයිකනය ක්ලික් කරන්න
මයික්‍රෝෆෝනය ක්‍රියාත්මක කිරීම සහ වීඩියෝ ක්‍රියාත්මක වීමට ඉඩදෙන්න
ප්‍රශ්නය හෝ ගැටලුව ඉදිරිපත් කරන්න
Step 11
ඡන්දය ප්‍රකාශ කිරීමේ අතුරු මුහුණත දිස්වීම
Step 12
ලබාදී ඇති අවකාශයේ ඡන්දය ප්‍රකාශ කරන්න
Step 12
“Submit” ක්ලික් කරන්න
සමාගම වෙත අදාල ප්‍රතිචාරය ලැබේ.